# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1725/19 – 2011 සැප්තැම්බර් 29 වැනි බ්‍රහස්පතින්දා – 2011.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: සී.අයි/1781.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 04, මෙල්බර්න් මාවතේ, අංක 27 හි පිහිටා ඇති සී/ස පැලවත්ත සීනි කර්මාන්තායතනය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බුත්තල, දික්යාය, බඩල්කුඹුර හි පිහිටි පැලවත්ත සීනි කර්මාන්තායතන ආරක්ෂක සංගමය අතර 2010 ඔක්තෝබර් මස 15 වැනි දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ.
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුව.

### 2011 අංක 34 දරන සාමූහික ගිවිසුම

සාමූහික ගිවිසුමයි.

කොළඹ 04, මෙල්බර්න් මාවතේ, අංක 27 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි නිසිපරිදි ලියාපදිංචි කරන ලද සී/ස පැල්වත්ත සීනි කර්මාන්තායතනය (මින් ඉදිරියට සේවා යෝජකයා ලෙස හඳුන්වනු ලබන) සහ බුත්තල, දික්යාය, බඩල්කුඹුර හි නිසිපරිදි ලියාපදිංචි කරන ලද ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් වන පැල්වත්ත සීනි කර්මාන්තායතන ආරක්ෂක සංගමය (මින් ඉදිරියට වෘත්තීය සමිතිය ලෙස හඳුන්වනු ලබන) සමඟ වර්ෂ 2010ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින කොළඹ දී ඇති කර ගනු ලබන ගිවිසුමයි.

වෘත්තීය සමිතිය විසින් සේවායෝජකයා වෙත ඉදිරිපත් කරන ලද සේවක වැටුප් සංශෝධනය සම්බන්ධව දෙපාර්ශවය විසින් පැමිණෙන ලද කොන්දේසි සහ එකඟතාවයන් මෙසේය.

1. *දෙපාර්ශවයේ ආවරණයන් සහ බැඳීම්.-* සේවායෝජකයා, වෘත්තීය සමිතිය සහ සී/ස පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සේවය කරනු ලබන මෙම වෘත්තීය සමිතියේ සාමාජිකයන් මෙම ගිවිසුමෙන් ආවරණය වේ.

1A – G 015123 – 365 (2011/09)

2. *බලපවත්වන කාලය සහ ගිවිසුම ක්‍රියාත්මක වීම.*- මෙම ගිවිසුම වර්ෂ 2010.06.01 වැනි දින සිට 2013.05.31 දින දක්වා බලපැවැත්වෙන අතර, වර්ෂ 2013.05.31 වැනි දිනට ප්‍රථම මෙම ගිවිසුම අවලංගු කිරීමට නොහැකි අතර, එසේ අවලංගු කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ද බලරහිත වේ. වර්ෂ 2013.05.31 වැනි දිනෙන් පසුව මසක දැනුම්දීමක් කර කිනම් පාර්ශවයකට හෝ මෙම ගිවිසුම අහෝසි කිරීමට ඉල්ලීමක් කළ හැක.

3. *වැටුප් සංශෝධනය.*- ගිවිසුම බල පැවැත්වෙන කාලය තුළ පහත සඳහන් වැටුප් සංශෝධන ලබා දීමට සේවායෝජකයා එකඟ වේ.

i. මෙම ගිවිසුමෙන් ආවරණය වන සියලු සේවකයින් සඳහා වර්ෂ 2010 ජුනි මස 01 සිට වර්ෂ 2011 මැයි මස 31 වැනි දින දක්වා වූ පළමු වසර සඳහා මසකට රු. 1,500/- බැගින් වැටුප් වැඩි කිරීමට සේවායෝජකයා එකඟ වන අතර, වර්ෂ 2010 ජුනි, ජූලි, අගෝස්තු මාසයන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප් සමාන වාරික දෙකකින් (උදා. රු. 2,250/- බැගින්) වර්ෂ 2010 සැප්තැම්බර් මස සහ ඔක්තෝබර් මස වැටුප සමඟ ගෙවීමට එකඟ වේ. ඉහත ගෙවිය යුතු හිඟ මුදල, සේවක භාරකාර අරමුදල (ETF), සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සහ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා අදාළ නොවන බවට දෙපාර්ශවය එකඟ වේ.

ii. වර්ෂ 2011 ජුනි මස 01 වැනි දන සිට වර්ෂ 2012 මැයි මස 31 වැනි දින දක්වා වූ දෙවන වසර සඳහා මසකට රු. 2,100/- බැගින් වූ වැටුප් වැඩි වීමක් ප්‍රදානය කිරීමට සේවායෝජකයා එකඟ වේ.

iii. වර්ෂ 2012 ජුනි මස 01 වැනි දින සිට වර්ෂ 2013 මැයි මස 31 වැනි දින දක්වා වූ තෙවන වසර සඳහා මසකට රු. 2,000/- බැගින් වූ වැටුප් වැඩිවීමක් ප්‍රදානය කිරීමට සේවායෝජකයා එකඟ වේ.

iv. ගිවිසුම බල පැවැත්වෙන කාලසීමාව තුළ වැටුප් සම්බන්ධයෙන් කිසිඳු ඉල්ලීමක් නොකිරීමටත් කළමනාකාරීත්වය අපේක්ෂිත සම්පූර්ණ නිෂ්පාදනය කරා ළඟා වීමට පූර්න දායකත්වය ලබා දීමටත් වෘත්තීය සමිතිය සේවායෝජකයා සමඟ එකඟ වේ.

4. *ආරාවුල් නිරාකරණය කිරීමේ කාර්යපටිපාටිය.*- කිනම් ආකාරයක හෝ කාර්මික ආරාවුලකදී පහත සඳහන් ආරාවුල් නිරාකරණය කිරීමේ කාර්යපටිපාටිය අනුගමනය කිරීමට වෘත්තීය සමිතිය සේවායෝජකයා සමඟ එකඟ වේ.


i. කිසියම් ආරාවුලකදී ප්‍රථමයෙන් ඒ සම්බන්ධව කළමනාකාරීත්වය දැනුවත් කොට සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට කටයුතු කිරීම.

ii. එසේ විසඳා ගැනීමට නොහැකි වුවහොත් එම ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත දැනුම් දී සමාදානයෙන් විසඳා ගැනීමට කටයුතු කළ යුතුය.

iii. මෙම ගිවිසුමෙන් ආවරණය වන කරුණු සම්බන්ධයෙන් කිසිඳු වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් නොගැනීමට වෘත්තීය සමිතිය එකඟ වේ. වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරන්නේනම් දින 14 කට පෙර කළමනාකාරීත්වය වෙත ඒ පිළිබඳව දැනුම් දීමට වෘත්තීය සමිතිය වැඩි දුරටත් එකඟ වේ.

iv. දැනුම්දීමකින් පසුව වෘත්තීය සමිතිය විසින් කිසියම් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළහොත්, ආරක්ෂක අංශය අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස සැලකීමේ අයිතිය කළමනාකාරීත්වය සතුය.

ඊට සාක්ෂි පිණිස ඉහත සඳහන් පාර්ශවයන් විසින් වර්ෂ 2010ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින කොළඹ දී ඒ දෙපාර්ශවයේ අත්සන් තැබුවෙමු.



මගේ අංකය: සීඅයි/1781.

## කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරිය

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 04, මෙල්බර්න් මාවතේ, අංක 27 හි පිහිටා ඇති සී/ස පැලවත්ත සීනි කර්මාන්තායතනය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, ඊ. ඩී. දාබරේ මාවත, අංක 158/18 හි පිහිටි අන්තර් සමාගම් සේවක වෘත්තීය සමිතිය, කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 301 හි පිහිටි ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පිහිටි ජාතික සේවක සංගමය, බුත්තල, දික්යාය, බඩල්කුඹුර, අංක 777 හි පිහිටි ඌව එක්සත් පොදු සේවක සංගමය අතර 2010 ඔක්තෝබර් මස 15 වැනි දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

## 2011 අංක 35 දරන සාමූහික ගිවිසුම

## සාමූහික ගිවිසුමයි

කොළඹ 04, මෙල්බර්න් මාවතේ, අංක 27 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි නිසිපරිදි ලියාපදිංචි කරන ලද සී/ස පැල්වත්ත සීනි කර්මාන්තායතනය (මින් ඉදිරියට සේවා යෝජකයා ලෙස හඳුන්වනු ලබන) සහ කොළඹ 05, ඊ. ඩී. දාබරේ මාවත, අංක 158/18 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් වන අන්තර් සමාගම් සේවක වෘත්තීය සමිතිය සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 301 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් වන ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය සහ පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් වන ජාතික සේවක සංගමය සහ බුත්තල, දික්යාය, බඩල්කුඹුර, අංක 777 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් වන ඌව එක්සත් පොදු සේවක සංගමය (මින් ඉදිරියට වෘත්තීය සමිතිය ලෙස හඳුන්වනු ලබන) සමඟ වර්ෂ 2010 ක් වූ ඔක්තෝබර් මස 15 වන දින කොළඹ දී ඇති කරගනු ලබන ගිවිසුමයි.

වෘත්තීය සමිතිය විසින් සේවායෝජකයා වෙත ඉදිරිපත් කරන ලද සේවක වැටුප් සංශෝධනය සම්බන්ධව දෙපාර්ශ්වය විසින් පැමිණෙන ලද කොන්දේසි සහ එකඟතාවයන් මෙසේය.

01. ***දෙපාර්ශවයේ ආවරණයන් සහ බැඳීම්.***– සේවායෝජකයා, වෘත්තීය සමිති සහ සී/ස පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සේවය කරනු ලබන මෙම වෘත්තීය සමිතිවල සාමාජිකයින් මෙම ගිවිසුමෙන් ආවරණය වේ.

02. ***බලපවත්වන කාලය සහ ගිවිසුම ක්‍රියාත්මකවීම.***– මෙම ගිවිසුම වර්ෂ 2010.06.01 වන දින සිට 2013.05.31 දින දක්වා බලපැවැත්වෙන අතර, වර්ෂ 2013.05.31 වන දිනට ප්‍රථම මෙම ගිවිසුම අවලංගු කිරීමට නොහැකි අතර, එසේ අවලංගු කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ද බලරහිත වේ. වර්ෂ 2013.05.31 වන දිනෙන් පසුව මසක දැනුම්දීමක් කර කිනම් පාර්ශ්වයකට හෝ මෙම ගිවිසුම අහෝසි කිරීමට ඉල්ලීමක් කළ හැක.

03. ***වැටුප් සංශෝධනය.***– ගිවිසුම බලපැවැත්වෙන කාලය තුළ පහත සඳහන් වැටුප් සංශෝධන ලබාදීමට සේවායෝජකයා එකඟ වේ.

(i) මෙම ගිවිසුමෙන් ආවරණය වන සියළු සේවකයින් සඳහා වර්ෂ 2010 ජුනි මස 01 සිට 2011 මැයි මස 31 වන දින දක්වා වූ පළමු වසර සඳහා මසකට රු. 1,500/- බැගින් වැටුප් වැඩි කිරීමට සේවායෝජකයා එකඟ වන අතර, වර්ෂ 2010 ජුනි, ජූලි, අගෝස්තු මාසයන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප් සමාන වාරික දෙකකින් (උදා: රු. 2,250/- බැගින්) වර්ෂ 2010 සැප්තැම්බර් මස සහ ඔක්තෝබර් මස වැටුප සමඟ ගෙවීමට එකඟ වේ. ඉහත ගෙවිය යුතු හිඟ මුදල, සේවක භාරකාර අරමුදල (ETF), සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සහ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා අදාළ නොවන බවට දෙපාර්ශ්වය එකඟ වේ.


(ii) වර්ෂ 2011 ජුනි මස 01 වන දින සිට 2012 මැයි මස 31 වන දින දක්වා වූ දෙවන වසර සඳහා මසකට රු. 2,100/- බැගින් වූ වැටුප් වැඩිවීමක් ප්‍රධානය කිරීමට සේවායෝජකයා එකඟ වේ.

(iii) වර්ෂ 2012 ජුනි මස 01 වන දින සිට වර්ෂ 2013 මැයි මස 31 වන දින දක්වා වූ තෙවන වසර සඳහා මසකට රු. 2,000/- බැගින් වැටුප් වැඩිවීමක් ප්‍රධානය කිරීමට සේවායෝජකයා එකඟ වේ.

(iv) ගිවිසුම බල පැවැත්වෙන කාලසීමාව තුළ වැටුප් සම්බන්ධයෙන් කිසිදු ඉල්ලීමක් නොකිරීමටත් කළමණාකාරීත්වය අපේක්ෂිත සම්පූර්ණ නිෂ්පාදනය කරා ළඟාවීමට පූර්ණ දායකත්වය ලබාදීමටත් වෘත්තීය සමිතිය සේවායෝජකයා සමඟ එකඟ වේ.

04. ***ආරාවුල් නිරාකරණය කිරීමේ කාර්යපටිපාටිය.***– කිනම් ආකාරයක හෝ කාර්මික ආරාවුලක් ඇතිවුවහොත් ඒ පිළිබඳව කම්කරු කොමසාරිස්වරයා වෙත දැනුම්දී කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදන අනුව එම ආරාවුල් විසඳා ගැනීමට කටයුතු කරන අතර, එසේ කිරීමට ප්‍රථමයෙන් කිසිදු ආකාරයක වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නොගැනීමට වෘත්තීය සමිතිය එකඟ වේ.

ඊට සාක්ෂි පිණිස ඉහත සඳහන් පාර්ශවයන් විසින් වර්ෂ 2010ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින කොළඹ දී ඒ දෙපාර්ශවයේ අත්සන් තැබුවෙමු.






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.